TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# සේවා සපයන්නන් සඳහා වන අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) ලෝකයේ දූෂණයට එරෙහි ප්‍රමුඛතම සංවිධානයක් වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ (TI) ශ්‍රී ලංකා ශාඛාව වන අතර එය ශ්‍රී ලංකාව තුළ යහපාලනය ප්‍රවර්ධනය කිරීමටත් සහ දූෂණය පිටුදැකීමටත් කැපවී සිටියි.

TISL ආයතනය සමඟ කරන රාජකාරී කටයුතුවල දී අල්ලස සහ දූෂණය කිසිසේත්ම නොඉවසන අතර, ඒ පිළිබඳ දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. සුපිළිපන්න බව සහ පාරදෘශ්‍යභාවය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් රකිමින් සිය ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට ඒ සියලු ආයතන හා සේවා සපයන්නන්ට මෙය හේතුවක් වනු ඇත.

ආයතනයට සේවා සපයන්නන් සේවා සපයන කාලය පුරාවට පහත දක්වා ඇති මූලධර්ම වලට අනුකූල විය යුතු අතර, සිය පාලනයට සහ බලපෑමට යටත් වන උප කොන්ත්‍රාත්කරුවන්, නියෝජිතයින් සහ/හෝ වෙනත් තෙවන පාර්ශ්වයන්ද එවාට අනුකූල වෙමින් කටයුතු කරන බවට වග බලා ගත යුතු වේ.

1. මිල ගණන් ඉදිරිපත් කිරීමේ සිට සේවා සපයන මුළු කාලසීමාව පුරා සේවා සපයන්නා, සිය පාලනයට සහ බලපෑමට යටත් උප කොන්ත්‍රාත්කරුවන්, නියෝජිතයින් හෝ වෙනත් තෙවන පාර්ශ්වයන්ද ඇතුළුව, අල්ලස් සහ/හෝ දූෂණ ක්‍රියාවල නොයෙදෙන බව සහතික කළ යුතුය.

2. සිය සේවා කාලය තුළ සේවා සපයන්නා රාජ්‍ය නිලධාරියෙකු හෝ පෞද්ගලික පාර්ශ්වයක් සමඟ අන්තර්ජාතික, ජාතික හෝ ප්‍රාදේශීය මට්ටමින් සෘජුව හෝ වක්‍රාකාරයෙන්, හෝ තෙවන පාර්ශ්වයක් මගින් අල්ලස් සහ දූෂණ කටයුත්තක නියැළීම නොකළ යුතුය.

3. TISL වෙත සේවා සැපයීම සඳහා සේවා සපයන්නා විසින් TISL සේවකයින්ටහට කිසිදු ආකාරයක අල්ලසක් පිරිනැමීම හෝ සදාචාර විරෝධී ක්‍රියාවන්හි නිරත වීම සිදු නොකළ යුතුය. පහසුකම් සැපයීමේ ගෙවීමක් (පහසුකරණ ගෙවීමක්) ලෙස සැලකිය හැකි ඕනෑම දෙයක් සෘජුව හෝ වක්‍රව යෝජනා කිරීම, පොරොන්දු වීම, දීම, ඉල්ලීම, පිළිගැනීම හෝ පිළිගැනීමට එකඟ වීම, හෝ ලබා ගැනීමට උත්සාහ කිරීම තහනම් වේ. යම් TISL සේවකයෙක් එවැනි දෙයක් ඉල්ලා සිටින්නේ නම් සේවා සපයන්නන් විසින් TISL වෙත වාර්තා කළ යුතුය.

4. කැඳවා ඇති කොන්ත්‍රාත් මිල ගණන් තක්සේරු කරන TISL සේවකයින්ගේ ව්‍යාපාරික තීරණ වලට තෑගි, ගෙවීම්, විවිධ අනුග්‍රහයන්, සේවා හෝ වෙනත් ප්‍රතිලාභ හරහා බලපෑම් කිරීමට හෝ බලපෑමක් වේ යැයි සිතිය හැකි දෙයක් කිරීමට සේවා සපයන්නා උත්සාහ නොකළ යුතුය.

5. යම් සේවා සපයන්නෙකු හෝ, ඔවුන්ගේ පාලනයට සහ බලපෑමට යටත් කොන්ත්‍රාත්කරුවෙකු, නියෝජිතයෙකු හෝ වෙනත් තෙවන පාර්ශ්වයක් හෝ අල්ලස් හෝ දූෂණ කටයුත්තක නියැළේ නම් TISL ආයතනය විසින් වහාම කොන්ත්‍රාත්තුව අවසන් කරනු ඇත. එමඟින් ලබා දෙන ලද සේවා සියල්ල ශූන්‍ය සහ බල රහිත තත්ත්වයකට පත් වනු ඇත. සේවා සපයන්නා, හෝ ඔවුන්ගේ පාලනයට සහ බලපෑමට යටත් කොන්ත්‍රාත්කරුවා, නියෝජිතයා හෝ තෙවන පාර්ශ්වය වෙත කළ යුතු ගෙවීම් රඳවා තබා ගැනිමටත්, එවැනි පාර්ශ්වයන්ට කළ ගෙවීම් නැවත ලබා ගැනීමටත් TISL ආයතනයට අයිතිය ඇත.

6. මෙහි දක්වා ඇති අල්ලස් සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වන ඕනෑම කාරණයක දී අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළහොත්, එම සේවා සපයන්නා විසින් ලබා දෙන සේවා අත්හිටුවීමටත් එවැන්නෙකු විසින් ලබා දෙන ලද මිළ ගණන් අහෝසි කිරීමටත් බලය TISL ආයතනයට හිමි වේ.

7. සේවා සපයන්නන්, ඔවුන්ගේ පාලනයට සහ බලපෑමට යටත් උප කොන්ත්‍රාත්කරුවන්, නියෝජිතයන් හෝ තෙවන පාර්ශ්වයන්ද ඇතුළුව, මිල ගණන් කැඳවීම එවන ලද දිනයෙන් අවසන් වන පසුගිය වසරේ දී සිදු කරන ලද අල්ලස් සහ දූෂණ වැරදි තිබේ නම් ඒ පිළිබඳව TISL ආයතනය වෙත දැනුම් දීමක් කළ යුතු වේ.

**නිර්වචන සහ පැහැදිලි කිරීම්:**

* අල්ලස් - ආයතනික ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී නීතිවිරෝධී යමක් සිදු කිරීම සඳහා පෙළඹවීමක් ලෙස මුදල්, ත්‍යාග හෝ වෙන යම් වාසියක් පිරිනැමීම, පොරොන්දු වීම, ලබා දීම, භාර ගැනීම, අයැදීම හෝ විශ්වාසය උල්ලංඝනය කරන වෙන යම් ක්‍රියාවක් අදහස් වේ.

* දූෂණය - පෞද්ගලික වාසිය තකා ලත් බලය අවභාවිත කිරීම වේ.

* පහසුකරණ ගෙවීම් - මේවා අල්ලස් වන අතර පහසුකරණ ගෙවීම සිදු කරන්නා නෛතිකව හෝ වෙන යම් ආකාරයකින් හිමිකම් කියන සාමාන්‍ය හෝ අත්‍යවශ්‍ය ක්‍රියාවක ක්‍රියාකාරීත්වය සුරක්ෂිත කිරීම හෝ කඩිනම් කිරීම වෙනුවෙන් කරන නිල නොවන ගෙවීම් වේ.

* තුටු පඬුරු සහ සත්කාර - මේවා කුඩා ත්‍යාගවල (දිනපොත් වැනි) සිට අධික මිලැති සත්කාර (ප්‍රධාන උත්සව අවස්ථාවලට ටිකට්පත්, නිවාඩු වැනි) දක්වා පරාසයක විහිදිය හැකිය. අනිසි හැසිරීමකට පොළඹවීමේ අදහසින්, අධික මිලැති ත්‍යාග සහ සත්කාර ආදිය වෙස් වළාගත් අල්ලසක් ලෙස භාවිත විය හැකිය.

* ඉල්ලීම - අල්ලස් හෝ වෙන යම් අපරාධයක් සිදු කිරීමට පුද්ගලයෙකු විසින් කරනු ලබන ඉල්ලීමක්, විධානයක් හෝ උපායමාර්ගිකව යොමු කිරීමක් වේ.

-----------------------------------------------------------------------------------------------

............................, වන මම, TISL ආයතනයෙහි සේවා සපයන්නන් සඳහා වන අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තියෙහි සඳහන් නියම සහ කොන්දේසි කියවා තේරුම් ගත් බවත්, ඒ සියල්ලට එකඟ වන බවත් දන්වා සිටිමි.

______________________________

අත්සන:

නම:

තනතුර:

ආයතනය:

දිනය: